# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2112/43 - 2019 මාර්තු මස 01 වැනි සිකුරාදා - 2019.03.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය*: 2018/18
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/6/2018/එච්ඩබ්ලිව්/20.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර*:

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, ගඟබඩ පත්තුව සුළු කොට්ඨාශයේ, බජ්ජන්කැලේ ගමේ, අංක. 327 බී, වලකන්ද නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් මාතර දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංකය. මාර 2765 හා 2019.01.09 දිනැති පිඹුරේ කැබලි අංක. 1 හි පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0962 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස් (01):

01. **කැබලි අංකය.** 1

ඉඩමේ නම: ගහලකොලමඩිත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, මිශ්‍ර වගාවක් ඇත; හිමිකම් කියන අය: කොඩිතුවක්කුගේ පියදාස, "විජය", ගහලකොලමඩිත්ත, වලකන්ද; මුල් හිමිකම් පාන්නා: - (හි.පි. 230525 සහ හි.පි. 230839 හි කොටස්); ප්‍රමාණය: හෙක්. 0.0962.

ඉහත සඳහන් ඉඩමට / පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2019.03.21 දින අනුව පෙරවරු 10.00 ට කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 2019.03.14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම / පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

චින්තක අබේවික්‍රම,
ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරී,
කිරින්ද පුහුල්වැල්ල.

2019 පෙබරවාරි මස 26 වැනි දින,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

03-812



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය*: ටීඑච්අයි/එල්එන්ඩී/එල්2/ජ්සීකිවුවීඅයි/152.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/6/2017/එච්ඩබ්ලිව්/372.

තිහගොඩ ප්‍රාදේශීය ලේකම් උමේෂා සුරංගි මාතරගේ වන මම දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීමට අදාලව නිකුත් කරන ලද 2019.01.10 දිනැති අංක 2015/44 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අතිවිශෙෂ *ගැසට්* පත්‍රයෙහි 1A පිටුවෙහි ප්‍රකාශයට පත් කරන ලද 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ *ගැසට්* නිවේදනයේ **හිමිකම් පරීක්ෂණ දිනය 2019.03.25 වන දින ලෙසද, ඊට අදාල ලියකියවිලි ඉදිරිපත් කලයුතු දිනය 2019.03.18 දින ලෙසද** සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

උමේෂා සුරංගි මාතරගේ,
ප්‍රාදේශීය ලේකම්,
තිහගොඩ.

2019 පෙබරවාරි මස 26 වන දින,
ප්‍රාදේශිය මහලේකම් කාර්යාලය,
තිහගොඩ.

03-813

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.